ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 09/04/2021

පැමිණිලි පාර්ශවය : එච්.ටී. තරංගා මිය.
280, ටොරින්ටන් මාවත,
කොළඹ 05.

වගඋත්තර පාර්ශවය : 01 විදුහල්පති,
විශාඛා විද්‍යාලය,
කොළඹ 05.

02 එස්.එම්. කීර්තිරත්න මයා,
සභාපති (විදුහල්පති, ආනන්ද විද්‍යාලය)
අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
විශාඛා විද්‍යාලය,
කොළඹ 05.

03 අධ්‍යක්ෂ (ජාතික පාසැල් ශාඛාව),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/417/19**

පැමිණිලි පාර්ශවයේ කරුණු සැලකිරීම =:

ඉහත පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති 2019.01.31 දිනැති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, තම දියණිය වන තිනුම් සිව්සරි කල්දේරා දැරිය 2019 වසරේ කොළඹ විශාඛා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

යටතේ 24/2018 චක්‍රලේඛය පරිදි අයදුම් පත්‍රයක් යොමු කළ බවත්, එම අයදුම් පත්‍රයට අනුව තමා සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබූ බවත් එහිදී ඉදිරිපත් කර තිබූ ලේඛන සඳහා මුළු ලකුණු 55.2 ක ප්‍රමාණයක් ලබාදී ඇති නමුත් තමන් ඉදිරිපත් කරන ලද නිවැරදි ලේඛන සඳහා ලකුණු 67;5 ක ප්‍රමාණයක් හිමිවිය යුතුව තිබූ බවත්ය. මෙම තත්වය මත තමා විසින් අභියාචනා විරෝධතා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ බවත්, එම අභියාචනා පරීක්ෂා කිරීමට කැඳවා තිබූ සාකච්ඡාවේදී තමන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු 67.5 ක ප්‍රමාණයක් ලැබිය යුතු බවට අදාළ ලේඛන ගෙන හැර දක්වමින් කරුණු ඉදිරිපත් කළද එමගින් සාධාරණයක් ඉටු නොවූ බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, 2019 වසරේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 24/18 චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අවශ්‍ය කඩඉම් ලකුණු ඉක්මවා තම දියණිය විශාඛා විද්‍යාලයට ඇතුළත් වීමට සුදුසුකම් පැවතියදී තම දරුවා එම පාසලට ඇතුළත් කර නොගැනීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තිය මගින් හිමිකර දී ඇති මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් ඉහත සඳහන් වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බැවින් ඒ සම්බන්ධව විමර්ශනයක් සිදු කර සහනයක් සලසා දෙන ලෙයසි.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු සැළ කිරීම =:

01 විදුහල්පතිනි, කොළඹ විශාඛා විද්‍යාලය, එස්.එස්.කේ. අවිරුප්පොල මියගේ කරුණු දැක්වීම

ඉහත පැමිණිල්ලට අදාලව ඉදිරිපත් කර ඇති 2019.05.10 දිනැති වාර්තාව මගින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ දියණිය වන නිනුම් දිව්සරි කල්දේරා දැරිය 2019 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා පාසලට ආසන්නතා ගණය යටතේ ඉදිරිපත් කර තිබූ අයදුම් පත්‍රය සලකා බලා සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබූ බවත් මෙම ගණය යටතේ අදාළ අයදුම්කරුවන්ගේ පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනය ලෙස 7.2.1 වගන්ති ප්‍රකාරව ඉහත අයදුම්කාරිය විසින් අංක 191, 695 හා 662 දරණ තෑගි ඔප්පු 03 ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත. නමුත් එම ඔප්පුවලට අදාළ පත්තිරු පරීක්ෂා කිරීමේදී, අංක 662 දරණ ඔප්පුව අනුව 2014 නොවැ. 05 දින වේරගොඩගේ කරුණාවතී යන අය විසින් කොළඹ 05, ටොරින්ටන් ඇවනියු, 280 හි හේවාවිතාරණ තිලිණි තරංගා යන අයට නිවස තෑගි දුන් බවට සඳහන්ව තිබූ බව දක්වා ඇත. තවදුරටත් පත්ඉරු පරීක්ෂාවේදී අංක 778 දරණ ඔප්පුව අනුව නැවතත් 2016 ඔක්. 03 දින හේවාවිතාරණගේ තිලිණි තරංගා යන අය විසින් කේශානි එරංගා හේවාවිතාරණ යන අයට වරිපනම් අංක 280 දරණ නිවස 2016.08.01 දින සිට 2018.07.31 දින දක්වා බදු දී ඇති බවට පැහැදිලි වූ බවත් දක්වා ඇත. ඇය විසින්

ඉදිරිපත් කර තිබූ ඔප්පු හා පත්‍රිකාවල ව්‍යාකූලතාව නිසාවෙන් 24/2018 චක්‍රලේඛය ප්‍රකාරව පදිංචිය සනාථ කෙරෙන වෙනත් පිළිගත හැකි ලේඛන යටතේ ඉදිරිපත් කර තිබූ විදුලි බිල්පත්, ජල බිල්පත්, වරිපනම් බදු බිල්පත් හා උප්පැන්න සහතික යන ලේඛන සඳහා 2013-2017 වර්ෂ දක්වා වසරකට ලකුණු 0.3 බැගින් ලකුණු 5.4 ක් ඇය වෙත ලබා දී ඇති බවද දක්වා ඇත.

එසේම පදිංචිය සනාථ කෙරෙන අතිරේක ලේඛන වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ දරුවාගේ උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ස්ථාවර දුරකථන බිල්පත්, පාසල හැරයාමේ සහතිකය හා විවාහ සහතිකය යන ලේඛන සඳහා වසරකට ලකුණු 0.2 බැගින් 2013-2017 වර්ෂ දක්වා ලකුණු 4.8 ක් හිමි වී ඇති බවත්, අයදුම්කාරිය හා කලත්‍රයා 2013-2017 වර්ෂය දක්වා ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී තිබීම වෙනුවෙන් උපරිම ලකුණු 25 ක් ද ලබා දී ඇති බවත් සඳහන් කර ඇත.

පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව සඳහා ලකුණු ලබා දීමේදී සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුජාතා විද්‍යාලය, විද්‍යාතිලක විද්‍යාලය, ඩඩ්ලි සේනානායක විද්‍යාලය, මහාමාත්‍ය විද්‍යාලය යන පාසල් 05 සඳහා එක් පාසලකට ලකුණු 04 බැගින් අඩුවන පරිදි මුළු ලකුණු 40 න් ලකුණු 20 ක ප්‍රමාණයක් ලබාදී ඇති බවද දක්වා ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් පැමිණිලිකාරිය පාසලට ඉදිරිපත් කර ඇති ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් හා අභියාචනා මණ්ඩලය මගින් මුළු ලකුණු 55.2 ලබා දී ඇති නමුත් 2019 වර්ෂයේ විශාඛා විද්‍යාලයේ ආසන්නතා ගණය යටතේ 1 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ කඩඉම් ලකුණු වූයේ ලකුණු 59 බැවින් පැමිණිලිකාරියගේ දියණියට එම අවස්ථාව අහිමි වූ බව විදුහල්පතිනිය විසින් සිය ලිඛිත කරුණු දැක්වීම මගින් පෙන්වා දී ඇත.

**ලේකම්/අධ්‍යක්ෂ (ජාතික පාසැල්) අධ්‍යාපන අමාත්‍යාංශයේ කරුණු දැක්වීම =:**

ඉහත වගඋත්තරකරුවන් වෙනුවෙන් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නීතිඥ ප්‍රදීප් නිශාන්ත මහතා විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළව පැමිණිලි පාර්ශවය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ අභියාචනා කමිටුව වෙත ද ඒ වනවිට පැමිණිලි කර ඇති බව ප්‍රකාශ කරන බැවින් ඒ සම්බන්ධයෙන් සලකා බලා ඉදිරියේදී පැමිණිලි පාර්ශවය වෙත අධ්‍යාපන අමාත්‍යාංශ අභියාචනා කමිටුවේ තීරණය දැනුම්දීමට කටයුතු කරනු ලබන බවයි.

සභාපති, අභියාචනා විරෝධතා මණ්ඩල (විදුහල්පති, කොළඹ විශාඛා විද්‍යාලය) කරුණු දැක්වීම

පැමිණිල්ලට අදාල විමර්ශන කටයුතු සඳහා විදුහල්පති, කොළඹ ආනන්ද විද්‍යාලය, එස්.එම්. කීර්තිරත්න මහතා 2019 ඔක්තෝබර් 03 දින සහ 2020 ජනවාරි 07 යන දිනවල කැඳවා තිබූ අතර 2019.10.03 දින කැඳවා තිබූ පරීක්ෂණයට රාජකාරීමය හදිසි අවශ්‍යතා හේතුවෙන් පැමිණීමට හැකියාවක් නොමැති බව ලිඛිතව දන්වා ඇත. 2020 ජනවාරි 07 දින කැඳවා තිබූ පරීක්ෂණයට හේතු නොදන්වා සහභාගී වී නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් 2019.10.02 දිනැතිව ඉහත වගඋත්තරකරු විසින් 2019¡10¡03 දින පැවැත්වෙන පරීක්ෂණයට සහභාගී වීමට හැකියාවක් නොමැති බව දන්වා ඇති ලිපියේ 03 වන ඡේදය යටතේ ප්‍රකාශ කර ඇත්තේ මෙම පැමිණිල්ලට අදාලව අවශ්‍ය විස්තර කොළඹ විශාඛා විද්‍යාලයේ විදුහල්පතිනිය වෙතින් ලබා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටින බවයි.

විමර්ශනය :-

මෙම පැමිණිල්ලට අදාලව සිදු කල වැඩිදුර විමර්ශනයේදී අදාල පාර්ශවකරුවන් අවස්ථා කිහිපයකදී කැඳවා සාකච්ඡා කර පැමිණිල්ල සමථයකට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇතත් පැමිණිලි පාර්ශවය වෙත අපේක්ෂා කරන සහනය සලසා දී පැමිණිල්ල සමථයකට පත්වීමට වගඋත්තරකාර පාර්ශවයන් එකගතාවය පළ කර නොමැත.

තවද විදුහල්පතිනි, කොළඹ විශාඛා විද්‍යාලය විසින් මෙම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාලව 2019.05.10 දාතමින් ලබාදී තිබූ ලිඛිත කරුණු දැක්වීම සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය විසින් තම නිරීක්ෂණ ලබාදීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් නැවත වතාවක් ඉහත විදුහල්පතිනිය වෙතින් ලිඛිත කරුණු දැක්වීමක් ලබා ගෙන ඇති අතර, එහිදීද විශාඛා විදුහල්පතිනිය ප්‍රකාශ කර ඇත්තේ ඊට පෙර ඉදිරිපත් කර තිබූ ලිඛිත කරුණු දැක්වීමේ සඳහන් කාරණාම බව නිරීක්ෂණය වේ. විශේෂයෙන් වැඩිදුර විමර්ශනයේදී 2019.09.16 දාතමින් පැමිණිලි පාර්ශවය විසින් විශාඛා විදුහල්පතිනිය ලබාදී ඇති ලිඛිත කරුණු දැක්වීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ සැලකීමේදී එහි 04 වන කරුණ ලෙස සඳහන් කර ඇති පාසලට ආසන්නතාව සඳහා පදිංචි ස්ථානයේ සිට ආසන්නයේ පවතින පාසල් 5 ක් වෙනුවෙන් ලකුණු 4 බැගින් අඩු කර ඇති බව සඳහන් වුවත් චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි කොළඹ මහාමාත්‍ය විද්‍යාලය සඳහා ලකුණු අඩු කිරීම චක්‍රලේඛයේ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් අත්තනෝමතිකව සිදු කර ඇති බවට පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන සාක්ෂි සහිත කරුණු දැක්වීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. මෙහිදී පැමිණිලි පාර්ශවය විසින් අදාල සිතියමක් ඉදිරිපත් කරමින් ඉදිරිපත් කර ඇති කරුණු දැක්වීම සැලකිල්ලට ගැනීමේදී කොළඹ මහාමාත්‍ය විද්‍යාලය සඳහා ආසන්න පාසල් සඳහා

ලකුණු අඩු කිරීමේ ක්‍රමවේදය යටතේ ලකුණු 4 ක් අඩු කිරීම නීත්‍යානුකූල බවට පිළිගැනීමේ හැකියාවක් නැත. මන්ද යත්. 24/2018 චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව කටයුතු කර ඇති බවට සනාථ කිරීම සඳහා පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් සිතියම් ගත කරන ලද අදාල සිතියමේ දැක්වෙන පරිදි කොළඹ මහාමාත්‍ය විද්‍යාලය අදාල වෘත්තය තුලට ඇතුලත් නොවීම සඳහන් කල හැකිය. ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් සාකච්ඡා කිරීම සඳහා විදුහල්පතිනි විශාඛා විද්‍යාලය සහ සභාපති අභියාචනා විරෝධතා මණ්ඩලය යන වගඋත්තරකරුවන් 2019.10.03 දින සහ 2020.01.07 යන දිනවල පැවති පරීක්ෂණ සඳහා කැඳවා ඇතත්. ඒ සඳහා තමන් හෝ නියෝජිතයින් හෝ සහභාගි කරවීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලි පාර්ශවය සාක්ෂි සහිතව ඉදිරිපත් කර ඇති එම තර්කය බිඳ හෙලීමට වගඋත්තරකාර පාර්ශවය වන විදුහල්පතිනි කොළඹ විශාඛා විද්‍යාලය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එම පාසල සඳහා ලකුණු 4 ක් කපා හැරීම නැතහොත් අඩු කිරීම චක්‍රලේඛයේ ප්‍රතිපාදන වලට පටහැනිව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලි පාර්ශවය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන පරිදි පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ තම අයදුම්පත සලකා බැලීමේදී කොළඹ මහාමාත්‍ය විද්‍යාලය සඳහා ලකුණු 4 ක් කපා දැමීම සිදු නොකලේ නම් තමන් වෙත ලබාදී ඇති මුළු ලකුණු 55.2 සහ මෙම ලකුණු 4 ද ඇතුලත්ව මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 59.2 දක්වා ඉහල යාම මත කඩඉම් ලකුණ ඉක්මවා යන බැවින් තම දියණියට විශාඛා විද්‍යාලයට ඇතුලත්වීමට අවස්ථාව තිබූ බවට ඉදිරිපත් කරන තර්කය සාධාරණ බව නිරීක්ෂණය වේ. තවද පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කර ඇති ලේඛන අනුව පැමිණිලිකාරිය වසර ගණනාවක සිට පැමිණිල්ල සඳහන් ලිපිනයේ පදිංචිව සිටින බවට සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලේඛන සාක්ෂි සපයයි. ඒවා අතර ජල බිල්පත්. විදුලි බිල්පත්. වරිපනම් ගාස්තු ගෙවීමට අදාල ලේඛන බැංකු ගිණුම්. රක්ෂණ ඔප්පු මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම ආදිය සහ අංක 438 හා 2003.03.06 දිනැති විවාහ සහතිකයද වේ. මේ අනුව බලන විට පැමිණිලිකාරිය පැමිණිල්ලේ සඳහන් ලිපිනයේ ස්ථිරව පදිංචිව සිටින බවට ප්‍රමාණවත් සාක්ෂි සපයා ඇති අතර. ඒ අනුව පැමිණිල්ල මගින් ඇය ප්‍රකාශ කරන පරිදි පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ ඇයගේ දියණිය 2019 වසරේ කොළඹ විශාඛා විද්‍යාලයේ පලමු ශ්‍රේණියට ඇතුලත් වීම සඳහා සුදුසුකම් සපුරා තිබූ බවට සහ තමන් ඉදිරිපත් කරන ලද නීත්‍යානුකූල ලේඛන සඳහා නිවැරදි ආකාරයෙන් ලකුණු ලබා දුන්නේ නම් තම දියණිය ඉහත පාසලට ඇතුලත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් ලකුණු හිමිවිය යුතු බවට සාක්ෂි මගින් තහවුරු කර ඇති බව නිරීක්ෂණය වේ.

නිරීක්ෂණ හා නිගමනය -:

ඉහත පරිදි මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් අනුව පැමිණිලි පාර්ශවය ප්‍රකාශ කරන පරිදි පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ තම දියණිය 2019 වසරේ කොළඹ විශාඛා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා අදාළ චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි සුදුසුකම් සපුරා තිබූ බව නැතහොත් ප්‍රමාණවත් ලකුණු ලබා ගෙන තිබූ බවට ඉදිරිපත් කරන කරුණු දැක්වීම සාධාරණ බව පෙනී යයි.

විශේෂයෙන්ම කොළඹ මහාමාත්‍ය විද්‍යාලය සඳහා ආසන්න පාසල් සඳහා ලකුණු අඩු කිරීමේදී වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර ඇති ආකාරය පිළිබඳව ගැටලු ඇති බවද පෙනී යයි. ඒ අනුව මහාමාත්‍ය විද්‍යාලය සඳහා ලකුණු අඩු කිරීමක් සිදු නොවූයේ නම් එම වසරේ විශාඛා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කර ගැනීම සඳහා ලබා ගතයුතු අවම ලකුණු සංඛ්‍යාව වන ලකුණු 59 සීමාවට ලගා වීමට පැමිණිලිකාරියට හැකියාව තිබූ බව නිරීක්ෂණය වේ. තවද ඇය අදාළ ලිපිනයේ පදිංචිව සිටින බවට තහවුරු කරගත හැකි ලේඛන ද පරීක්ෂණයේදී ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය =:

ඉහත නිරීක්ෂණ සලකා බැලීමේදී පැමිණිලිකාරියගේ දියණිය 2019 වසරේ විශාඛා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් වීමට පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ සුදුසුකම් සපුරා තිබියදී අවස්ථාව ලබා නොදීම මගින් වගඋත්තරකාර පාර්ශවයන් වන විදුහල්පතිනි, විශාඛා විද්‍යාලය ඇතුළු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ ඒ සම්බන්ධයෙන් අභියාචනා පරීක්ෂා කර ඇති සභාපති ඇතුළු අභියාචනා විරෝධතා සලකා බැලීමේ මඬුල්ල විසින් පැමිණිලිකාරිය වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කරදී ඇති මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය =:

ඉහත නිරීක්ෂණ හා නිගමන අනුව පැමිණිලිකාරියගේ දියණිය 2019 වසරේ කොළඹ විශාඛා විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වීමට සුදුසුකම් සපුරා තිබූ බව පරීක්ෂණයේදී අනාවරණය වී ඇති බැවින් විශාඛා විද්‍යාලයට පැමිණිලිකාරියගේ දියණිය

ඇතුළත් කර ගැනීම සඳහා කටයුතු කරන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ විදුහල්පතිනිය විශාඛා විද්‍යාලය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.05.12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

B/